*සැ. යු.* - 2023.02.03 දින පළ වූ අංක 2318 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,319 - 2023 පෙබරවාරි මස 10 වැනි සිකුරාදා - 2023.02.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 46 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 මාර්තු මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 පෙබරවාරි මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


45- B 082427— 353 (2023/02)
D 1 -

# පිස්කල් විකිණීම්

## අත්තනගල්ල දිසා අධිකරණයේ දී ය

### පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

සිය ප්‍රධාන කාර්යාලය, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටියා වූ ද, සිය ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131 දරන තැන පිහිටියා වූද, වේයන්ගොඩ ශාඛා කාර්යාලයක් පිහිටියා වූ ද, මහජන බැංකුව,

නඩු අංකය : 175/MB
ඇස්කීසි අංකය : 73/2022
ස්වභාවය : උකස් බැඳුම්කර
පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 1,000,000

*......................පැමිණිලිකරු.*

*එදිරිව*

බාලසූරිය ආරච්චිගේ ශානක සඳරුවන්,
අංක 14/1,
දංවිලාන, වේයන්ගොඩ.

*.............................විත්තිකරු.*

වර්ෂ 2019 ක් වූ ජූලි මස 05 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශයට අනුව ඉහත නම් සඳහන් විත්තිකරු හා පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීමට නියම කළ රුපියල් නව ලක්ෂයයි ශත හතරක් (රු.900,000.04) මුදලක් සහ එකී මුදල මත 2013.06.12 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 22% බැගින් පොළිය ද, සහ වෙනත් ව්‍යවස්ථාපිත ගාස්තු ද, ඉන් අනතුරුව සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරන තුරු තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල මත නෛතික පොළි ය ද, නඩු ගාස්තු ද, පැමිණිලිකරුට ගෙවන ලෙස විත්තිකරුට නියම කරන ලෙස ද, එසේ ගෙවීම පැහැර හැරියහොත් එකී ඉඩම් සහ ගොඩනැගිලි වෙන්දේසිකරුවෙකු විසින් විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් ලබා ගත යුතු බවට ද, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2022.12.14 වන දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල,

**වර්ෂ 2023 ක් වූ මාර්තු මස 08 වැනි දින ප.ව. 2.30 ට** ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිශ්චල දේපළ පිහිටි අංක 14/1, දංවිලාන, වේයන්ගොඩ දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 328/සී, දංවිලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දංවිලාන ග්‍රාමයෙ හි පිහිටි ''පරගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ මහතා විසින් මැන සාදන ලද අංක 3978 සහ 2005.10.12 දිනැති පිඹුරේ නිරූපිත ලොට් 2 දරන කොටසට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | ලොට් 1 සහ ලොට් 3, |
| නැගෙනහිරට | : | එම්. ඒ. ෂෙල්ටන්ට අයිති ඉඩම (එස්. පී. ආර්. පතිරාජ බලයලත් මිනින්දෝරුතැනගේ අංක 3569 පිඹුරේ දක්වෙන ඉඩම) |
| දකුණට | : | ප්‍රාදේශීය සභා පාර (දඩගමුව සිට කළගෙඩිහේන පාරට යාවන) |
| බස්නාහිරට | : | ලොට් 3 |

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම දෙකක් (රූ. 1, පර්. 8.2) විශාල ඉඩම් කොටස හා එය තුළ පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ ඊට අයිති සියලු දේද වේ. මෙම ඉඩම අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක B343/43 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත. ඉහත කී පිඹුරේ මාර්ග අයිතිය ද සමඟ වේ.

*ගෙවීමේ ක්‍රමය.-*

01. වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මුදලෙන් 25% ක් එම අවස්ථාවේදී ම ගෙවිය යුතුය.

02. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත අත්තනගල්ල දිසා අධිකරණයේ මෙම නඩුවට අදාලව තැන්පත් කළ යුතුය.

03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, අත්තනගල්ල.

වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 30 වැනි දින දී ය.

02-126

---

**ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව,
අංක : 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*.......................පැමිණිලිකරු.*

නඩු අංකය : 239/18/MB
ඇස්කීසි අංකය : 04/2022

*එදිරිව*

ගොඩපතිරගේ අනිල් සනත් පෙරේරා,
අංක : 03,
විජේසේකර පාර, දෙහිවල.

*............................විත්තිකරු.*

වර්ෂ 2020 දෙසැම්බර් මස 03 වැනි දින ගල්කිස්ස දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව විත්තිකරු විසින් රුපියල් දහතුන් ලක්ෂ අනූ නව දහස් හත්සිය තිස් හතයි ශත පනස් දෙකක (රු. 1,399,737.52) මුළු මුදලක් සහ එකී මුදල මත 2013.10.12 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් එම සම්පූර්ණ මුදල මත 20.5% ක පොළිය සහ රුපියල් ලක්ෂ හතක (රු.700,000) ක මුදල හා එකී මුදල මත 2015.10.12 දින සිට සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා 15.5% ක ප්‍රමාණයට පොළිය ද, නඩු ගාස්තු ද ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට ද, නියෝග කොට තීන්දු කර ඇත.

එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී හෝ පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති අධිකාරී බලපත්‍රයේ බලයපිට මා විසින් දැනටමත් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල.

**වර්ෂ 2023 ක් වූ මාර්තු මස 16 වන දින පෙ.ව. 10.00ට** ඉහත නම සඳහන් විත්තිකරුගේ දේපල පිහිටි මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, කඳපොල ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ, කඳපොල නමැති ගමේ පිහිටි ''පොසිවුඩ් එස්ටේට්'' නමැති ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, කඳපොල ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ, කඳපොළ නමැති ගමෙහි පිහිටි ''පොසිවුඩ් එස්ටේට්'' නමැති ඉඩම සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති පී. පී. ඒ. 1067 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 17 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : වතු පාර ද, නැගෙනහිරට : ලොට් අංක 19 හා 18 දරන ඉඩම් ද, දකුණට : ලොට් අංක 22 දරන ඉඩම ද, බටහිරට : ලොට් අංක : 13 සහ 16 දරන ඉඩම් ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් විස්සක් (රූ. 02, පර්. 20.00) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙම දේපල බලයලත් මිනින්දෝරු ඩබ්. බී. කේ. එච්. ගුණවර්ධන විසින් 2002.08.22 දින මැන සාදන ලද අංක : 664 පිඹුරේ ලොට් : අංක 01 මගින් ද නිරූපනය වේ.) මෙම දේපළ නුවරඑළිය ඉඩම් කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු අංක LDO A01/14 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්
දිසා අධිකරණය - නුවරඑළිය.

වර්ෂ 2023 ක් වූ පෙබරවාරි මස 01 වැනි දින,
නුවරඑළිය දිසා අධිකරණයේ දී ය.

02-166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.